
جمعية خدمة المحتوى
الإسلامي باللغات

ضيوف الرحمن
hajjumrh.com



# උම්රා ඉටු කරන ක්‍රමය හා එහි නීති පිළිබඳ කෙටි සටහන

ضيوف الرحمن
hajjumrh.com

شركاء التنفيذ :

دار الإسلام
بيان الإسلام
رواد التراجم
المحتوى الإسلامي

يتاح طباعة هذا الإصدار ونشره بأي وسيلة مع
الالتزام بالإشارة إلى المصدر وعدم التغيير في النص

Tel : +966 50 244 7000
info@islamiccontent.org
Riyadh 13245-2836
www.islamiccontent.org

සියලු පැසසුම් විශ්වයේ පරමාධිපති අල්ලාහ්ට ම හිමි ය. අපගේ නබිවරයාණන් වන දේව දූත මුහම්මද් තුමාණන්ටත් එතුමාණන්ගේ පවුලේ උදවියටත් එතුමාණන්ගේ මිතුරන් ඇතුළු සියලු දෙනා හටත් ශාන්තිය හා සමාදානය අත් වේවා!

මෙම ප්‍රකාශයෙන් පසු:

මෙය උම්රා ඉටු කිරීමේ ක්‍රමය, එහි නීතිරීති හා අචාර විධි පිළිබඳ කෙටි ලිපියකි. මෙහි උම්රා ඉටු කරන අයකු සඳහා අවශ්‍ය වන බොහෝ දෑ පැහැදිලි කිරීමට අපි අපේක්ෂා කළෙමු.

මෙය ගෞරවණීය අල්ලාහ්ගේ තෘප්තිය උදෙසා කෙරෙන අවංක සේවයක් ලෙස හා පොදුවේ මුස්ලිම්වරුන් හට ප්‍රතිලාභ ගෙන දෙන්නක් ලෙස මෙය පත් කර දෙන මෙන් අපි ඔහුගෙන් ඉල්ලා සිටිමු.

**විවිධ භාෂාවන්ගෙන් ඉස්ලාමීය කරුණු අන්තර්ගත සේවා සංගමයේ අධ්‍යාපන කමිටුව**

ضيوف الرحمن
hajjumrh.com

# පළමුව: නැමදුම පිළිගනු ලැබීමේ කොන්දේසි.

## නැමදුම සර්වබලධාරී අල්ලාහ් අභියස පිළිගනු ලැබීමට නම්, කොන්දේසි දෙකක් ඇත:

### 1 ඉඛ්ලාස් හෙවත් අවංකභාවය:

**එනම් එමගින් අල්ලාහ්ගේ තෘප්තිය හා මතුලොව අපේක්ෂා කිරීමය.**

සර්වබලධාරී අල්ලාහ් මෙසේ පවසයි:

وما أمروا إلا ليعبدوا الله مخلصين له الدين حنفاء،

තවද පිවිතුරු දහම අල්ලාහ්ට පුද කරමින් ඔහු ව නැමදීමටත් සලාතය ස්ථාපිත කිරීමටත් z සකාත් පිරිනැමීමටත් මිස ඔවුහු අණ කරනු නොලැබුවෝය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්)[1] තුමාණෝ මෙසේ පැවසූහ:

"إنما الأعمال بالنيات، وإنما لكل امرئ ما نوى"

"ක්‍රියාවන් පිහිටනුයේ චේතනාවන් අනුවය. සෑම පුද්ගලයකුටම ඔහු පතන දෑ ඇත."

බුහාරී (1), මුස්ලිම් (1907)

### 2 එහි දී නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ව ප්‍රකාශයෙන් හා ක්‍රියාවෙන් පිළිපැදීම:

"من أحدث في أمرنا هذا ما ليس منه فهو رد"

"අපගේ කටයුත්තට (ඉස්ලාමයට), එහි නොමැති නවීන ක්‍රම සහ වීධි කවරෙකු ඇතුළු කරන්නේ ද එය ප්‍රතික්ෂේප කරනු ලැබේ."

බුහාරී (2697) මුස්ලිම් (1718). තවද මුස්ලිම් හි සඳහන් වාර්තාව (1718) මෙසේය:


"من عمل عملا ليس عليه أمرنا فهو رد.

"අප විෂයයෙහි නොමැති ක්‍රියාවක්, කවරෙකු සිදු කරන්නේද එය ප්‍රතික්ෂේප කරනු ලැබූවකි."



1- එහි අර්ථය වනුයේ: ඔහු හා ඔහුට නැමදුම් කිරීම අපේක්ෂා කරමින්, ඔහු හැර අනෙකුත් සියලු දෑ ප්‍රතික්ෂේප කරමින් සිදු කිරීමයි. 'තෆ්සීර් අස්-සඃදී' (පිටු. 538)

ضيوف الرحمن
hajjumrh.com



# දෙවන්න: උම්රාහි ක්‍රමය හා එහි නීතිරීති හැදෑරීමේ නීතිය.

සර්වබලධාරී අල්ලාහ්ට යම් නැමදුමක් ඉටු කිරීමට අපේක්ෂා කරන්නා ඒ පිළිබඳව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ මඟපෙන්වීම හැදෑරිය යුතුය. එය ඔහුගේ ක්‍රියාව සුන්නා පිළිවෙතට අනුගත වනු පිණිසය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ එතුමාණන්ව අනුගමනය කරන මෙන් ද එතුමාගේ මඟ පෙන්වීම තුළින් මඟ ලබන මෙන් ද ජනයා උනන්දු කළහ. මාලික් ඉබ්නු අල්-හුවෙයිරිස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මෙසේ ප්‍රකාශ කළහ:

"صلوا كما رأيتموني أصلي"

"මා සලාතය ඉටු කරනු ඔබ දුටු සේ ඔබ ද සලාතය ඉටු කරන්න" බුහාරි (6008) ජාබිර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී:

"رأيت النبي صلى الله عليه وسلم يرمي على راحلته يوم النحر ويقول: لتأخذوا مناسككم؛ فإني لا أدري لعلي لا أحج بعد حجتي هذه"

"නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තම වාහනය මතට වී අවුරුදු දින ගල්කැට විසි කරමින් "නුඹලාගේ නැමදුම් පිළිබඳ හදාරනු. මක්නිසාදයත් මාගේ මෙම හජ් වන්දනාවෙන් පසු හජ් කරන්නට පුළුවන් වේ දැයි මම නො දනිමි." යැයි පවසනු මම දුටුවෙමි. මෙය මුස්ලිම් විසින් වාර්තා කරන ලදී. (1297)

# තුන්වැන්න: උම්රා වන්දනාවෙහි මහිමය

## උම්රා සඳහා **පොදු හා විශේෂ** මහිමයන් දෙකක්

### පොදු මහිමය:

1 අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී.

(العمرة إلى العمرة كفارة لما بينهما، والحج المبرور ليس له جزاء إلا الجنة)

"උම්රා ව අනෙක් උම්රා ව දක්වා ඒ දෙක අතර සිදු වන පාපයන්ට වන්දිය වන්නේය. විධිමත් ව ඉටු කරනු ලබන හජ් ඒ සඳහා වූ ප්‍රතිඵලය ස්වර්ගය මිස වෙනෙකක් නොමැත."

බුහාරී (1773) මුස්ලිම් (1349)

---

2 අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී:

(تابعوا بين الحج والعمرة؛ فإنهما ينفيان الفقر والذنوب كما ينفي الكير[2] خبث الحديد والذهب والفضة وليس للحج المبرور ثواب إلا الجنة)

"හජ් සහ උම්රා අනුක්‍රමිකව ඉටු කරන්න; මන්ද රන්, රිදී හා යකඩවල කිලිටි, උදුන ඉවත් කරන මෙන් ඒ දෙක දුප්පත්කම සහ පාපය ඉවත් කරනු ඇත. පිළිගනු ලැබූ හජ් වන්[2]දනාවට ස්වර්ගය හැර වෙනත් විපාක කිසිවක් නැත."

තිර්මිදි (810), අන්-නසාඊ (2631)

---

### විශේෂ මහිමය රමළානයේ සිදු කරන උම්රාව.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී:

"عمرة في رمضان تقضي حجة معي[3]"

"රමළාන් මස ඉටු කරනු ලබන උම්රාව මා සමග හජ් වන්දනාව ඉටු කරන්නාක් මෙනි."[3]

බුහාරී (1863) මුස්ලිම් (1256)

---

2- මව්ලිඃ නාරිල් හිදාද් වස්-සාඉඝ්. ඉබ්නු අබ්දුල්-බිර්තුමාගේ හැඳින්වීම (15/102)
3- එනම්: මා සමග හජ් ඉටු කිරීමට සමාන වන්නේය. එය තවත් වාර්තාවක සඳහන් වී ඇති පරිදිය.

ضيوف الرحمن
hajjumrh.com

# උම්රා ඉටු කිරීමේ ක්‍රමය



# පළමුව: මීකාත් හෙවත් සීමා මාඉම් පිළිබඳ නීතිරීති:

1. **අල්-මීකාත්:** හජ් හෝ උම්රා ඉටු කිරීමට අපේක්ෂා කරන උදවිය ඉහ්රාම් පැළඳ ගැනීම සඳහා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් නියම කළ ස්ථාන වේ.

---

2. හජ් හෝ උම්රා ඉටු කිරීමට අදිෂ්ඨාන කරමින් කවරෙකු ඒ එක් ස්ථානයක් අසළින් ගමන් ගන්නේ ද එහි දී ඉහ්රාම් තත්ත්වයට පැමිණීම ඔහුට අනිවාර්යය වේ. ඉහ්රාමය පැළඳ ගැනීමෙන් තොරව එය පසුකර යෑම වලංගු වන්නේ නැත.

---

3. කවරෙකු මෙම මීකාත් හෙවත් සීමා මඉම්වලට වඩා මක්කාවට සමීපයෙන් පදිංචිව සිටින්නේ ද ඔහුගේ සීමා මාඉම ඔහු සිටින ස්ථානයම වේ. එතැන් සිට ඔහු හජ් හා උම්රා සඳහා ඉහ්රාම් පළඳියි.

---

4. මක්කාවාසීන් වනාහි, ඔවුන් අතරින් කවුරුන් ඉහ්රාම් සඳහා අදිටන් කර ගත්තේ ද ඔවුහු මක්කාවේ සිට හජ් සඳහා ඉහ්රාම් පැළඳ ගනිති. එහි දී උම්රා සඳහා ඔවුන් තන්ඊම් හෝ එවන් විවෘත ප්‍රදේශයකට ගොස් එහි දී ඉහ්රාම් පැළඳ ගනිති.

ضيوف الرحمن
hajjumrh.com

5. කවරෙකු ගුවන් යානයක සිටින්නේ ද ඇත්තෙන්ම ඔහු අදාළ සීමා මායිමට සමාන්තරව අනුගත වූ විට ඉහ්රාම් තත්ත්වයට පැමිණේ. අදාළ මීකාතයට අනුගත වීමට පෙර ඒ සඳහා පූර්ව සූදානමින් ඉහ්රාම් ඇඳුම අඳියි. එයට අනුගත වීමත් සමග ඒ තත්ත්වයේ ඉහ්රාමයේ චේතනාව තබයි. ගුවන් තොටුපලින් බසින තෙක් එය ප්‍රමාද කිරීම ඔහුට වලංගු වන්නේ නැත. පූර්ව ප්‍රවේසමක් වශයෙන් ගුවන් යානය වේගයෙන් ගමන් කරන බැවින් අදාළ මීකාතයට අනුගත වීමට පෙර තල්බියා පැවසීම මඟ හැරෙනු ඇතැයි බියක් වී නම් ඊට පෙරම ඔහු තක්බීර් පැවසිය හැක.



# දෙවැන්න: ඉහ්රාමයේ ක්‍රමය හා එහි නීති රීති.

**ඉහ්රාමය පැළඳීමට අදිටන් කරන්නා පහත සඳහන් දෑ ඉටු කිරීමට ආගමික වශයෙන් බැඳී සිටියි.**

1. **ස්නානය කිරීම:** පිරිමින් හා කාන්තාවන්, ඔසප් තත්ත්වයේ පසුවන හා පශ්චාත් දරු ප්‍රසූතියෙන් පසු රුධිර වහනය වන තත්ත්වයේ පසුවන කාන්තාවන් ඇතුළුව සියලු දෙනා ස්නානය කර ගැනීම වඩාත් වැදගත් සුන්නාවකි.

2. පුද්ගලයකුට ලැබෙන **උඳ් හෝ එවැනි වඩාත් සුවඳැති** සුවඳ විළවුන් ඔහුගේ හිසට හා ඔහුගේ යටි රැවුලට ගැල්වීම. ඉහ්රාම් ඇඳගත් පසු පවා එය පැවතීම ඔහුට හානියක් වන්නේ නැත. කාන්තාව වනාහි, සුවඳැති සුවඳ විළවුන් ගැල්වීම ඇයට සුදුසු වන්නේ නැත. මක්නිසාදයත් ඇයගේ සුවඳ පිටස්තර පිරිමින් ආග්‍රාණය කිරීමට ඉඩ ඇති බැවිනි.



3. **ඉහ්රාම් වස්ත්‍රය ඇඳීම,** එය උඩු සළුවක් හා යටි සළුවකි. සුන්නාව වනුයේ ඒ දෙකම පිරිසිදු මෙන්ම සුදුවන් දෙකක් වීමය. එසේ නැතහොත් දෙකම අලුත් වීම ය. කාන්තාවගේ ඉහ්රාම් ඇඳුම වනාහි, අලංකාරය ඉස්මතු නොකරන, ඇය අදින කැමති ඇඳුමකි. නමුත් ඇය මුහුණු ආවරණය හෝ අත් වැසුම් පැළඳීමෙන් වැළකී සිටිය යුතුය. ඒ හැර වෙනත් දැයකින් ඇගේ මුහුණු හා අත් දෙක ආවරණය කර ගනී.

4.ආගමානුගත කරන ලද අනිවාර්යය හෝ අතිරේක සලාතයකින් පසු ඉහ්රාම් පැළඳීම. එය අනිවාර්යය නොවේ.

5.ඔහු මෙසේ පවසයි: لبيك اللهم عمرة "ලබ්බයික් අල්ලාහුම්ම උම්තරන්" (දෙවිඳුනි, මා ඔබ වෙතට හඹා එමි, උම්රාව ඉටු කිරීමේ අදිටනින්) උම්රා ඉටු කරන්නා වෙනත් කෙනෙකු වෙනුවෙන් ඉටු කරන්නෙකු නම් ඔහු: لبيك اللهم عمرة عن فلان "ලබ්බයික් අල්ලාහුම්ම උම්රතන් අන් ෆුලානින්" (දෙවිඳුනි, මා ඔබ වෙතට හඹා එමි, මේ පුද්ගලයා වෙනුවෙන් උම්රාව ඉටු කිරීමේ අදිටනින්)

6.ඉහ්රාමය සඳහා අපේක්ෂා කරන තැනැත්තා තම වන්දනා කටයුතු සම්පූර්ණ කිරීමට බාධා කරන යම් බාධකයක් ගැන බිය වූයේ නම්, ඉහ්රාම් පළඳින අවස්ථාවේ මෙසේ කොන්දේසි පනවා ගත යුතුයි. එනම්: "දෙවිඳුනි, මා ඔබට පිළිතුරු දෙමින් හඹා එමි, යම් බාධකයක් මා අවහිර කළේ නම්, එය මා බාධා කළ තැනින් සිට මම ඉන් ඉවත් වෙමි.) එසේ කවරෙකු කොන්දේසි පනවාගෙන ඔහුගේ වන්දනා කටයුතු සම්පූර්ණ කිරීමට යම් බාධාවක් ඔහුට ඇති වූ විටෙක ඔහුට ඉහ්රාමයෙන් ඉවත් විය හැකි අතර ඒ සඳහා ඔහු කෙරෙහි කිසිදු ප්‍රතිකර්මයක් නොපිහිටනු ඇත.

7.පසුව අධික ලෙස තල්බියා පැවසිය යුතුය. එනම්: لبيك اللهم لبيك، لبيك لا شريك لك لبيك، إن الحمد والنعمة لك والملك لا شريك لك

'ලබ්බයික් අල්ලාහුම්ම ලබ්බයික්, ලබ්බයික් ලා ෂරීක ලක ලබ්බයික්, ඉන්නල් හම්ද වන්-නිඃමත ලක වල් මුල්ක ලා ෂරීක ලක"(4) පිරිමියා මෙය උස් හඬින් පවසයි. කාන්තාව ද පිටස්තර පිරිමින් නැති තැන එසේ උස් හඬින් පවසන්නීය. ඉහ්රාම් ඇඳගත් තැනැත්තා අධික ලෙස තල්බියා පැවසිය යුතුය. විශේෂයෙන් තත්ත්වයන් හා කාලයන් වෙනස් වන විට, උදාහරණයක් ලෙස ඉහළට නගින විට උස් හඬින් ද පහළට බසින විට පහත් හඬින් ද රාත්‍රිය හෝ දහවලට එළැඹෙන විට ද යනාදියෙනි.

4- මිනිසා පවසන මෙම ප්‍රකාශයේ තේරුම "ලබ්බයික්" එනම්: මාගේ පරමාධිපතියාණනි, නොකඩවා මම ඔබට පිළිතුරු දෙමි. එහි තේරුම: මිනිසා තම පරමාධිපතිට අවනත විය යුතු කරුණ ක්‍රියාත්මක කිරීම සඳහා පිළිතුරු දීමකි. "ඉන්නල් හම්දු වන්නිඃමත ලක වල් මුල්ක්" මෙහි 'හම්ද්' යනු ආදරයෙන් හා ගෞරවයෙන් යුතු පූර්ණ ප්‍රශංසාව හිමි වීමේ ගුණාංගයයි. එසේ නැවත නැවත පවසන විට පැසසුමක් බවට පත් වේ. 'නිඃමත' යනු අල්ලාහ් තම ගැත්තන් හට ඔවුන්ගේ අවශ්‍යතා ලබා දීමෙන් හා පිළිකුල් සහගත දැයින් ඔවුන් වැළැක්වීමෙන් ඔහුට කරන ආශිර්වාදයයි. 'අල්-මුල්ක්' යන ප්‍රකාශය වනාහි අල්ලාහ් සතු සර්ව රාජ්‍යයයි. උත්තරීතර අල්ලාහ් අති උත්කෘෂ්ට ය. ඔහු පමණය අධිපති. 'ලා ෂරීක ලහු' යන ප්‍රකාශය වනාහි, එනම් අල්ලාහ්ට නියම වූ පරිපූර්ණ ගුණාග කිසිවක්, ඔහුට සම කළ හැකි කිසිවක් නොමැති බව ය. සර්ව රාජ්‍යයේ හිමිකාරත්වය ඔහුට පමණක් සතුය. එය මැවීමේ සා සැලසුම් කිරීමේ බලය හා දේව බලය යනාදියයි. මජ්මූඃ ෆතාවා වරසාඉලිල් උසෙයිමීන් (22/96) සාරාංශය.

8.උම්රා වන්දනාවෙහි තල්බිය්යා පැවසීම ආගමානුගත වනුයේ ඉහ්රාම් ඇඳගත් අවස්ථාවේ සිට තවාෆ් ඉටු කිරීම ආරම්භ කරන තෙක් ය.

9.ඉහ්රාම් ඇඳගත් තැනැත්තා, ඉහ්රාමයෙන් නිදහස් වන තෙක් ඉහ්රාමය තුළ තහනම් කරන ලද කිසිදු කරුණක නියැලීමෙන් ප්‍රවේසම් වීම අනිවාර්යය වේ.

## තුන්වැන්න: තවාෆ් කිරීමේ ක්‍රමය

1.ඉහ්රාම් ඇඳගත් තැනැත්තා මස්ජිදුල් හරාම් වෙත පිවිසුනු විටෙක දකුණු කකුල ඉදිරියට තබා මස්ජිදයට පිවිසීමේ දී පැවසිය යුතු ප්‍රාර්ථනාව සහ ඒ සම්බන්ධයෙන් වාර්තා වී ඇති නිවැරදි ප්‍රාර්ථනාවන් උසුරා පිවිසීම සුන්නත් වේ. اللهم افتح لي أبواب رحمتك "අල්ලාහුම්මෆ්තහ්ලී අබ්වාබ රහ්මතික" (දෙවිඳුනි, ඔබේ ආශිර්වාදයේ දොරටු මා වෙනුවෙන් විවෘත කරනු මැනව) මෙය මස්ජිදුල් හරාමයට පමණක් සීමා වූ ප්‍රාර්ථනාවක් නොව කවර හෝ මස්ජිදයකට පිවිසුණ ද මෙම ප්‍රාර්ථනාව උසුරනු ලැබේ.

2.පසුව තවාෆ්හි නිරත වීමට අපේක්ෂා කළ විටෙක, තල්බිය්යා පැවසීම අවසන් කර ගනියි. පසුව ඉළ්තිබාඃ ක්‍රමයට ඉහ්රාමය සකසා ගනී. එනම් උඩු සළුවේ මැද කොටස දකුණු කිහිල්ල තුළ තබා, එහි කෙළවරවල් දෙක වම් උරහිස මත තැබීමය. තවාෆය අවසන් කළ විට තවාෆයට පෙර පැවති තත්ත්වයටම නැවත ඔහුගේ සළුව වෙනස් කර ගනී. ඊට හේතුව ඉළ්තිබාඃ ක්‍රමය පිළිපදිනු ලබනුයේ තවාෆ් සිදු කරන ස්ථානයේ පමණක් වන බැවිනි.





3.පසුව හජරුල් අස්වද් (කළු ගල) වෙත ඉදිරියට ගොස්, එම ගල තම දකුණතින් ස්පර්ශ කොට එය සිප ගනී. සිප ගැනීමට පහසුකමක් නොලැබේ නම් එය අතින් පමණක් ස්පර්ශ කර පසුව අත සිප ගනී. එසේ අතින් ස්පර්ශ කිරීමටත් ඔහුට පහසුකමක් නොලැබුවේ නම් ඔහු සමග ඇති සැරයටිය හා එවැනි යම් වස්තුවකින් එය ස්පර්ශ කර පසුව එය සිප ගනී. එයට ද පහසුකමක් නොලැබුවේ නම් ගල දෙසට මුහුණලා අතින් ඒ වෙත සංඥා කරයි. එය සිප නොගනියි. වඩාත් උතුම් වන්නේ තදබදයක් ඇති නොවන්නටත්, ජනයාට හානියක් නොවන්නටත් එමගින් ඔවුන් පීඩාවට පත් නොවන්නටත් වගබලා ගැනීමයි.

4.ගල ස්පර්ශ කරන අවස්ථාවේ හෝ එයට සළකුණු කරන අවස්ථාවේ "අල්ලාහු අක්බර්" (අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය) යැයි පැවසීම.

5.පසුව දකුණු දෙසට ගොස් තම වම් පැත්තට ශුද්ධ ගෘහය පිහිටන සේ සිටගෙන තවාෆ් සිදු කරයි. රුක්නුල්යමානියට ළඟා වූ විටෙක එය සිප ගැනීමකින් තොරව සපර්ශ කරයි, ඒ සඳහා පහසුකමක් නොමැත්තේ නම්, තදබදයක් ඇති කර නොගත යුතුය. ඒ වෙත යොමු නොවිය යුතුය.

---

6.රුක්නුල්යමානි සහ හජරුල් අස්වද් අතර මෙසේ පවසයි:

رَبَّنَا آتِنَا فِي الدُّنْيَا حَسَنَةً وَفِي الْآخِرَةِ حَسَنَةً وَقِنَا عَذَابَ النَّارِ

"රබ්බනා ආතිනා ෆිද් දුන්යා හසනතන් වෆිල් ආකිඃරති හසනතන් වකිනා අදාබන් නාර්" (අහෝ අපගේ පරමාධිපතියාණනි, මෙලොවෙහි යහපත අපට පිරිනමනු මැනව, මතුලොව යහපත ද අපට පිරිනමනු මැනව. තවද අපා ගින්නේ දඬුවමින් අප ආරක්ෂා කරනු මැනව.)

---

7.හජ්රුල් අස්වද් කොණ පසු කර යන සෑම අවස්ථාවකම තම අතින් ඒ දෙස සළකුණු කර 'අල්ලාහු අක්බර්' යැයි පවසයි.

---

8.තවාෆයේ ඉතිරි අවස්ථාවන්හි තමන් කැමති දික්ර්, ප්‍රාර්ථනා හා කුර්ආන් කියවීම් සිදු කරයි.

9.සුන්නාව වනුයේ පළමු වට තුන පමණක් රම්ල් දිවීමය. රම්ල් යනු පියවරවල් ළඟ ළඟ තබා මද වේගයකින් ගමන් කිරීමය.



10.තවාෆ් සම්පූර්ණ කළේ නම්, මකාම් ඉබ්රාහීම් වෙත ගොස් මෙසේ පාරායනය කරයි: (وَاتَّخِذُوا مِنْ مَقَامِ إِبْرَاهِيمَ مُصَلًّى), "වත්තකිදූ මින් මකාමි ඉබ්රාහීම මුසල්ලා" (ඔබ ඉබ්‍රාහිම්ගේ ස්ථානය සලාත් ඉටු කරන ස්ථානයක් ලෙස ගන්න.) පසුව පහසුකම් ඇතොත් එම ස්ථානයට පසුපසින් රකආත් දෙකක් ඉටු කරයි. එසේ නොමැති නම්, මස්ජිදයේ කවර හෝ ස්ථානයක රකආත් දෙකක් සලාත් ඉටු කරයි. පළමු රකආතයේ සූරා අල්-ෆාතිහාවට පසු පහත සඳහන් සූරාව පාරායනය කරයි: (قُلْ يَا أَيُّهَا الْكَافِرُونَ) "කුල් යා අය්යුහල් කාෆිරූන්" දෙවන රකආතයේ සූරා අල්-ෆාතිහාවට පසු පහත සඳහන් සූරාව පාරායනය කරයි:
(قُلْ هُوَ اللَّهُ أَحَدٌ).
"කුල් හුවල්ලාහු අහද්"

# සිව්වැන්න: සඊ කරන ක්‍රමය.

1.තවාෆ් කටයුතු අවසන් කර ඊට අදාළ රකආත් දෙක ද ඉටු කර පසුව ඔහු සඊ නැමදුම කරන ස්ථානය වෙත පිය නගයි. සෆා කන්දට ළඟා වෙත්ම මෙසේ පාරායනය කරයි:

(إِنَّ الصَّفَا وَالْمَرْوَةَ مِنْ شَعَائِرِ اللَّهِ)

"ඉන්නස් සෆා වල්මර්වත මින් ෂආඉරිල්ලා"

(සැබැවින්ම සෆා හා මර්වා (කඳු දෙක) අල්ලාහ්ගේ සංඥා අතරිනි)

පසුව ඔහු මෙසේ පවසයි:

أبدأ بما بدأ الله به

"අබ්දඋ බිමා බදඅල්ලාහු බිහි"

(අල්ලාහ් කවර දෙයකින් ආරම්භ කළේ ද එයින් මම ආරම්භ කරමි.)



2.පසුව කඃබාව දකින තරමට හෝ ඒ දිශාවට යොමු විය හැකි අයුරින් 'සෆා' කන්දට නැග ඒ දිශාවට මුහුණලා අල්ලාහ්ව ඒකීයත්වයට පත් කරමින් හා ශ්‍රේෂ්ඨත්වයට පත් කරමින් මෙසේ ප්‍රකාශ කරයි.

لا إله إلا الله وحده لا شريك له، له الملك وله الحمد، وهو على كل شيء قدير، لا إله إلا الله وحده، أنجز وعده، ونصر عبده، وهزم الأحزاب وحده

"ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහූ ලා ෂරීක ලහූ, ලහුල් මුල්කු වලහුල් හම්දු, වහුව අලා කුල්ලි ෂෙයිඉන් කදීර්, ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහූ, අන්ජස වඃදහූ, වනසර අබ්දහූ, වහසමල් අහ්සාබ වහ්දහූ"

(නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නැත. ඔහු ඒකීයය. ඔහුට සමාන කිසිවෙකු නැත. සර්ව රාජ්‍යය ඔහු සතුය. සියලු පැසසුම් ද ඔහු සතුය. ඔහු සියලු දෑ කෙරෙහි සර්වබලධාරීය. නැමදුමට සුදුස්සා අල්ලාහ් පමණක් හැර වෙනත් දෙවියෙකු නැත. ඔහුගේ ප්‍රතිඥාව ඔහු සැබෑ කළේය. ඔහුගේ ගැත්තාට ඔහු උපකාර කළේය. ඔහු තනිවම සියලු සේනාවන් පාරාජයට පත් කළේය.)

3.පසුව සෆා කන්දෙන් බැස මර්වා වෙත පා ගමනින් යයි. කොළ පැහැති සංඥාව වෙත ළඟා වූ විට මද වේගයෙන් කඩිසර ලෙස දැඩිව ගමන් කරයි. දෙවන කොළ සංඥා වෙත ළඟා වූ විට සුපුරුදු පරිදි ගමන් කරයි. දැඩි සේ වේගයෙන් ගමන් කිරීම කාන්තාවන්ට ආගමානුගත කරන ලද්දක් නොවේ.

4.මර්වා වෙත ළඟා වූ විටෙක, මර්වාවෙහි කටයුතු කළ ආකාරයෙන්ම එහි ද කටයුතු කිරීම ආගමානු ගත කරන ලදී. (පරිච්ඡේද අංක 2)

5.පසුව මර්වා සිට බැස නැවත සෆා වෙත පා ගමනින් යයි. කොළ පැහැති සංඥාව වෙත ළඟා වූ විට මද වේගයෙන් කඩිසර ලෙස දැඩිව ගමන් කරයි. දෙවන කොළ සංඥා වෙත ළඟා වූ විට සුපුරුදු පරිදි ගමන් කරයි.

6.මෙලෙස වට හත සම්පූර්ණ කරන තෙක්ම කටයුතු කරයි. සෆා කන්දේ සිට මර්වා කන්ද දක්වා පිය නැගීම එක් වටයක් ලෙස සැළකේ. එමෙන්ම මර්වා සිට නැවත සෆා වෙත නැවත පැමිණීම තවත් වටයක් ලෙස සැළකේ.




7. ඔහු සඊ කරන අතරවාරයේ ඔහු කැමති දික්ර් (ගුණගායනා) ප්‍රාර්ථනාවන් හා කුර්ආන් පාරායනයන්හි නිරත වෙයි.

## පස්වැන්න: හිසකෙස් කොට කිරීම හා බූ ගෑමේ ක්‍රමය:

1.උම්රා ඉටු කරන්නා තම තවාෆ් හා සඊ සම්පූර්ණ කළ විට, ඔහු පිරිමියෙක් නම් හිස බූ ගෑම හෝ හිසකෙස් කොට කිරීම අනිවාර්යය වේ. සුන්නාව වනුයේ බූ ගෑම හෝ කොට කිරීම සම්පූර්ණ හිස ආවරණය වෙන සේ සිදු වීමය.

2.හිස බූ ගෑම හිසකෙස් කොට කිරීමට වඩා උතුම් ය. නමුත් හජ් වන්දනා කාලයට සමීප නම් හිසේ හිසකෙස් වැවීමට ඉඩ ප්‍රස්ථාව ද ඇහිරී ගියේ නම්, එවිට කොට කිරීම වඩාත් යෝග්‍යය වේ.

3.කාන්තාවක් නම්, ඇගේ හිසකෙස්වල අගිස්ස ඇඟිලි පුරුකක තරම් කොට කර ගනියි.



# ඉහ්රාම් තත්ත්වයේදී තහනම් වන දෑ

**ඉහ්රාම් තත්ත්වයේදී තහනම් වන දෑ මෙසේය:**

1.ශරීරයේ කවර හෝ ස්ථානයකින් වුව ද රෝම මුඩු කිරීම හෝ කොට කිරීම හෝ උගුලා දැමීම .

---

2.අත් හා පාදවල නියපොතු සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ කපා ඉවත් කිරීම.

---

3.තොප්පිය, සළුව, ජටාව වැනි ශරීරය සමග ඇළී ඇති දැයකින් හිස ආවරණය කිරීම, හිස මතට පැළඳ ඇති සළුව එළීම, හිස මතට ලෙන්සුවක් හෝ පොරෝණයක් හෝ කාට්බෝඩ් කැබැල්ලක් හෝ තැබීම, එසේත් නැතහොත් ආවරණය යන අර්ථයෙන් එන කවර හෝ වෙනත් දෙයක් තැබීම. මෙය කාන්තාවට නොව පිරිමියාට පමණක් අදාළ වන නීතියකි.

4.ශරීරයට ගැලපෙන පරිදි සුපුරුදු ඇඳුම් ඇඳීම, එනම් සාමන්‍යයෙන් ඇඳුමෙන් සැරසීමය. උදාහරණ ලෙස මිම්මට මැසූ ඇඳුමක්, කලිසමක්, කමිසයක්, මේස් ජෝඩුවක් අත්වැසුම් ජෝඩුවක් වැනි දෑ ය. මෙය කාන්තාවට නොව, පිරිමියාට පමණක් විශේෂිත තහනමකි. ඇයට තහනම් කරනු ලැබ ඇත්තේ:

□නිකාබයක් හෝ බුර්කාවක් හෝ නිකාබයට සමාන වස්ත්‍රයක් පැළඳීම. පිටස්තර පිරිමින් ඉදිරියේ සුපුරුදු මුහුණු ආවරණයෙන් තම මුහුණ ආවරණය කළ යුතුය. එම ආවරණය ඇගේ මුහුණ ස්පර්ශ කළත් එලෙස ය. ඇගේ මුහුණ ස්පර්ශ වීම වැළැක්වීම සඳහා හිස් වැස්මක් හෝ ඒ හා සමාන දෙයක් ඇගේ හිස මත පැළඳීමට ඇයට අවසර නැත. මන්ද එහි ආගමික වශයෙන් කිසිදු සාක්ෂියක් නොමැති බැවිනි.

□ඇගේ අත් දෙකෙහි අත් වැසුම් පැළඳීම. නමුත් පිටස්තර පිරිමින් ඉදිරියේ ඇගේ කබාය තුළ අත් දෙක සඟවා ගනිමින් ඇය ඒ දෙක ආවරණය කළ යුතුයි.

5.ශරීරයට හෝ ඉහ්රාම් ඇඳුමට සුවඳ විළවුන් ගැල්වීම.
6.ගොඩබිම සතුන් මරා දැමීම හෝ මරා නොදැමුවත් උන් දඩයම් කිරීම.
7.තමන් වෙනුවෙන් හෝ වෙනත් කෙනෙකු වෙනුවෙන් හෝ විවාහය ගැන කතා කිරීම.
8.විවාහය ගිවිස ගැනීම
9.සංසර්ගයේ නිරත නොවූව ද කාමුක හැඟීමෙන් යුතුව සිප ගැනීම හා ස්පර්ශ කිරීම වැනි අඹුසැමි ඇසුරැකම් පැවැත්වීම.
10.සංසර්ගයේ නිරත වීම, එනම් යෝනි මාර්ගයේ ලිංගිකව හැසිරීම.

වඩාත් මැනවින් දන්නා අල්ලාහ් ය.
අපගේ නබි මුහම්මද් තුමාණන් හට අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අත්වේවා!

# උම්රා වන්දනාවේ ක්‍රියාකාරකම්වල සාරාංශය. (කවරයේ හෝ අවසන් පිටුවේ හෝ සඳහන් වෙයි)

1.ජලස්නානය.

2.සුවඳවිලවුන් ගැල්වීම.

3.ඉහ්රාම් වස්ත්‍රය ඇඳීම

4.ඉහ්රාම් යනු වන්දනාව තුළ ප්‍රවේශ වීමේ අධිෂ්ඨානයයි.


5.තල්බියයා පැවසීම.

6.දේව ගෘහය වටා තවාෆ් කිරීම.

7.මකාම් (ඉබ්‍රාහිම් තුමාගේ ස්ථානයට) පසුපසට වී රකආත් දෙකක් ඉටු කිරීම.

8.සෆා සහ මර්වාහ් අතර සඊ ඉටුකිරීම.

9.හිස මුඩු කිරීම හෝ හිසකෙස් කොට කිරීම.



ضيوف الرحمن
hajjumrh.com

# පටුන


| | |
|---|---|
| උම්රා ඉටු කරන ක්‍රමය හා එහි නීති පිළිබඳ කෙටි සටහන | 3 |
| හැඳින්වීම | 4 |
| පළමුව: නැමදුම පිළිගනු ලැබීමේ කොන්දේසි. | 4 |
| දෙවන්න: උම්රාහි ක්‍රමය හා එහි නීතිරීති හැදෑරීමේ නීතිය. | 6 |
| තුන්වැන්න: උම්රා වන්දනාවෙහි මහිමය | 8 |
| උම්රා ඉටු කිරීමේ ක්‍රමය | 10 |
| පළමුව: මීකාත් හෙවත් සීමා මාඉම් පිළිබඳ නීතිරීති: | 10 |
| දෙවැන්න: ඉහ්රාමයේ ක්‍රමය හා එහි නීති රීති. | 12 |
| තුන්වැන්න: තවාෆ් කිරීමේ ක්‍රමය | 18 |
| සිව්වැන්න: සඊ කරන ක්‍රමය. | 23 |
| පස්වැන්න: හිසකෙස් කොට කිරීම හා බූ ගෑමේ ක්‍රමය: | 27 |
| ඉහ්රාම් තත්ත්වයේදී තහනම් වන දෑ | 28 |
| උම්රා වන්දනාවේ ක්‍රියාකාරකම්වල සාරාංශය. (කවරයේ හෝ අවසන් පිටුවේ හෝ සඳහන් වෙයි) | 31 |

# تعرف على الإسلام

## بأكثر من 100 لغة

موسوعة القرآن الكريم
QuranEnc.com

ترجمات متقنة لمعاني القرآن الكريم بأكثر من (75) لغة

بيان الإسلام
byenah.com

مواد منتقاة للتعريف بالإسلام وتعليمه بأكثر من (120) لغة

موسوعة الأحاديث النبوية
HadeethEnc.com

ترجمات متقنة للأحاديث النبوية وشروحها بأكثر من (60) لغة

ضيوف الرحمن
hajjumrh.com

مواد منتقاة للحجـــاج والمعتمرين و الزوار بلغات العالم

جامع المحتوى الإسلامي باللغات
islamcontent.com

مواد إسلامية متنوعة وشاملة بأكثر من (125) لغة

موسوعات وخدمات إسلامية باللغات
s.islamenc.com

للمزيد من المواقع الإسلامية بلغـــات العـــالم

ضيوف الرحمن
hajjumrh.com

جمعية خدمة المحتوى الإسلامي باللغات